කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමු වසර පරීක්ෂණය (බාහිර) - 2014**

2019 - ජූනි/ජූලි

**B COM E 1055 – ව්‍යාපාර නීතිය හා කාර්මික නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව - අටයි (08) කාලය : පැය තුනයි (03)

ඔබ විසින් එක් කොටසකින් **ප්‍රශ්න දෙක (02) බැගින්** තෝරා ගෙන **මුළු ප්‍රශ්න (පහකට) 05** පිළිතුරු සපයන්න

---

1 කොටස

01. අ. වලංගු ගිවිසුමක තිබිය යුතු අත්‍යවශ්‍ය මූලිකාංග මොනවාද ? සුදුසු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

( ලකුණු 12 )

ආ. අනුර, රාත්‍රී භෝජනය සඳහා ආපන ශාලාවකට පැමිණෙන ලෙස බණ්ඩාර වෙත ආරාධනා කරයි. බණ්ඩාර අදාල ආරාධනාව පිළි ගන්නා ලදී. නියමිත දින බණ්ඩාර අදාල ආපනශාලාව වෙත ගිය අතර අනුර එහි පැමිණ සිටියත් බණ්ඩාර වෙත රාත්‍රී භෝජනය ලබා දීම ඔහු විසින් ප්‍රතික්ෂේප කරන ලදී. අනුර සහ බණ්ඩාර අතර වලංගු ගිවිසුමක් ඇතිදැයි පැහැදිලි කරන්න.

( ලකුණු 08 )

( මුළු ලකුණු 20 )

02. අ. මෝටර් රථයක් විකිණීම සඳහා ජෝන් වෙළඳ දැන්වීමක් පළ කළ අතර එහි සඳහන් වූයේ අදාල රථය වර්ෂ 2000 දී නිෂ්පාදිත බවයි. ඩේවිඩ් අදාල මෝටර් රථය පරීක්ෂා කර බලා මිලදී ගැනීමට තීරණය කරන ලදී. එම රථය මිලදී ගැනීමෙන් අනතුරුව ඩේවිඩ්ට පෙනී ගියේ අදාල රථයේ පසුපස කොටස පමණක් විස්තරයට අනුකූලව බවයි. එහි ඉදිරිපස කොටස වෙනත් රථයක කොටසක් බවත් එය පසුපස කොටස සමඟ පුරුද්දා ඇති බවත් හෙළි විය. දැන් ඩේවිඩ්ට අදාල ගිවිසුම අහෝසි කිරීමට අවශ්‍යව ඇත. ඔහුට උපදෙස් දෙන්න.

( ලකුණු 10 )

ආ. විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට අදාල කොන්දේසි සහ වොරන්ටි අතර වෙනස්කම් පෙන්වා දෙන්න.

( ලකුණු 10 )

( මුළු ලකුණු 20 )

03. අ. "වාණිජමය එකඟත්වයකදී, නියෝජ්‍යත්ව සම්බන්ධතාවය නිර්මාණය කිරීම ලිඛිත එකඟත්වයක් මත සිදුවේ. නමුත් නියෝජ්‍යත්ව සම්බන්ධතාවය නිර්මාණය කරන එකම ක්‍රමය මෙය පමණක් නොවේ." නියෝජ්‍යත්වය සම්බන්ධතාවය නිර්මාණය කරන ක්‍රම 04 ක් සුදුසු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

( ලකුණු 12 )

ආ. නියෝජිතයෙකු සතු යුතුකම් 04 ක් සුදුසු නිදසුන් ඇසුරින් දක්වන්න.

( ලකුණු 08 )

( මුළු ලකුණු 20 )

04. අ. ගණුදෙනු කළ හැකි ලියවිල්ලකට අදාල ප්‍රධාන ලක්ෂණ මොනවාද ?

( ලකුණු 08 )

ආ. ඇන්, සිය දියණිය රෝෂිනි සහ බෑනානුවන් වන ගිහාන්, නිමි ඇඳුම් ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් විය. ඔවුන් සිය හවුල් ව්‍යාපාරය සීමාසහිත පුද්ගලික සමාගමක් බවට පත් කිරීමට කටයුතු කරයි. හවුල් ව්‍යාපාරයක්, සමාගමක් බවට පත් කිරීමෙන් අත්පත් කර ගත හැකි වාසි සහ අවාසි මොනවාදැයි ඔවුනට උපදෙස් දෙන්න.

( ලකුණු 12 )

( මුළු ලකුණු 20 )

## 11 කොටස

05. "රැකියා ගිවිසුමක නීත්‍යානුකූල පදනම වන්නේ වැඩ කිරීමට පොරොන්දු වීමත් ඒ උදෙසා වැටුප් ගෙවීමට පොරොන්දු වීමත් යන පොරොන්දු හුවමාරු කර ගැනීම වන අතර දනට විවිධ වූ රැකියා ගිවිසුම් ගණනාවක් ඇත."
ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ වූ රැකියා ගිවිසුම් මොනවාදැයි සුදුසු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

( මුළු ලකුණු 20 )

06. 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල පනත පිළිබඳව පහත සඳහන් දෑ කෙරෙහි අවධානය යොමු කරමින් සටහනක් ලියන්න.

- අ. පනත යටතේ ආවරණය වන සේවකයන්
- ආ. වැඩ කරන කාලය
- ඇ. පොදු නිවාඩු
- ඉ. වාර්ෂික නිවාඩු
- ඊ. මාතෘ ප්‍රතිලාභ

( මුළු ලකුණු 20 )

07. අ. කාර්මික ආරවුල් නිරවුල් කිරීම සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනතේ සඳහන් විවිධ වූ ක්‍රම කවරේද?

( ලකුණු 06 )

ආ. "කාර්මික ආරවුලක් යනු කුමක්ද ? " සුදුසු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

( ලකුණු 08 )

ඇ. අනිවාර්ය බේරුම්කරණය සහ ස්වේච්ඡා බේරුම්කරණය අතර ඇති සමාන අසමානකම් දක්වන්න.

( ලකුණු 06 )

( මුළු ලකුණු 20 )

08. අ. සිය පාරිතෝෂික දීමනාව ගණනය කිරීම සහ කරන ලද අඩු කිරීම් සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන සේවකයෙකුට ඇති සහනය කුමක්ද ?

( ලකුණු 02 )

ආ. පාරිතෝෂික ගෙවීම් සම්බන්ධයෙන් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත් යටතේ ආවරණය වන සේවායෝජකයන් කවුරුන්ද ?

( ලකුණු 06 )

ඇ. "වැඩ වර්ජනය කිරීම යනු නිත්‍යානුකුල වෘත්තීය සමිති ක්‍රියාවකි. නමුත් මෙම අයිතිවාසිකම් යම් යම් සීමාවන්ට ලක් වී ඇත". වැඩ වර්ජනය කිරීම පිළිබඳව ඇති සීමාවන් මොනවාදැයි සුදුසු උදාහරණ ඇසුරින් දක්වන්න.

( ලකුණු 12 )

( මුළු ලකුණු 20 )